# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## ගණිතය - 3 ශ්‍රේණිය / තෙවන වාරය - සැප්තැම්බර් මාසය - පළමු සතිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

ටී.ඩබ්.නිපුන් කාවින්ද ලීලාරත්න - ර/පුස්සැල්ල මහා විද්‍යාලය

## 25 ඒකකය - මුදල් 2

01. ආදරණීය දුවේ පුතේ මෙම ක්‍රියාකාරකම සිදු කිරීමට පහත සඳහන් ආකාරයට සකස් කර ගත් මිල දර්ශනයක් වගේ ම මුදල් නෝට්ටුවල ආකෘති හෝ සැබෑ මුදල් නෝට්ටු කිහිපයකුත් සපයා ගන්න.

| පලතුර | මිල |
|---|---|
| අඹ | රුපියල් 20 |
| දොඩම් | රුපියල් 40 |
| කොමඩු | රුපියල් 150 |
| ඇපල් | රුපියල් 70 |
| අන්නාසි | රුපියල් 50 |
| ගස්ලබු | රුපියල් 100 |

**(මුදල් නෝට්ටුවල ආකෘති - එක නෝට්ටුවකින් 2 බැගින් ගන්න)**

**රුපියල් 20** | **රුපියල් 50** | **රුපියල් 100**

- සැබෑ මුදල් නෝට්ටු හෝ කඩදාසිවලින් සකසා ගත් මුදල් නෝට්ටු දරුවන්ට ලබා දෙන්න.
- සකසා ගත් මිල දර්ශනය පෙන්වා එය පලතුරු කඩයක ඇති පලතුරුවල මිල බව පැහැදිලි කරන්න.
- ඒවා එකින් එක දරුවන් සමඟ කියවන්න.
- එම එක් එක් පලතුරක් මිල දී ගන්නේ නම් ගෙවිය යුතු මුදලට අදාළ මුදල් නෝට්ටු තෝරා පෙන්වීමට දරුවන්ට අවස්ථාව දෙන්න.

02. ඉහත මිල දර්ශනයේ සඳහන් එක් එක් පලතුර මිලදී ගැනීමට ගෙවිය යුතු මුදලට අදාළ නොට්ටු (කඩදාසිවලින් සකසන ලද) පලතුරෙහි නම ඉදිරියෙන් අභ්‍යාස පොතෙහි අලවන්න.

උදාහරණ :- **ඇපල් -** **රුපියල් 20** | **රුපියල් 50**

03. භාණ්ඩයක යම් වටිනාකමක් ගෙවූ විට ලැබෙන ඉතුරු මුදල ගණනය කිරීමට අදාළ පහත වගුව සම්පූර්ණ කරන්න.

| දුන් මුදල | භාණ්ඩයේ මිල | ඉතුරු මුදල |
|---|---|---|
| රුපියල් 10 | රුපියල් 8 | රුපියල් 2 |
| රුපියල් 15 | රුපියල් 10 | .............................. |
| රුපියල් 20 | රුපියල් 10 | .............................. |
| රුපියල් 50 | රුපියල් 30 | .............................. |
| රුපියල් 100 | රුපියල් 70 | .............................. |

04. භාණ්ඩ දෙකක මිලෙහි එකතුව ගණනය කර ගෙවිය යුතු මුදල සොයන්න.

i. හංසිකා වෙළඳසැලකින් රුපියල් 10ක් වටිනා පැන්සලක් සහ රුපියල් 20ක් වටිනා අඩිකෝදුවක් මිල දී ගත්තා. ඒ සඳහා ගෙවූ මුදල කීය ද?

ii. අමර පලතුරු වෙළඳසැලකින් රුපියල් 15ක අඹ ගෙඩියක් ද රුපියල් 20ක දොඩම් ගෙඩියක් ද මිල දී ගත්තේ ය. ඔහු ඒ සඳහා ගෙවූ මුදල කීය ද?

iii.සිසුවෙකු වෙළඳසැලකින් රුපියල් 50ක පොතක් සහ රුපියල් 30ක කතුරක් මිල දී ගත්තා. ඔහු ඒ සඳහා ගෙවිය යුතු මුදල සොයන්න.

05. ගණිතය වැඩපොතේ පිටු අංක 39, 40, 41 පිටුවල ඇති අභ්‍යාස සිදු කරන්න.